

### රජය සතු විශාලතම අලෙවිසැල් ජාලය සඳහා

# නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ප්‍රසම්පාදන (කොන්ත්‍රාත් පදනම)

**සුදුසුකම්**

**භාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ අලෙවිකරණය, ව්‍යාපාර කළමණාකරණය හෝ වාණිජ විෂය පිළිබඳ ප්‍රථම උපාධියක්,

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්) හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත (Associate) / පූර්ණ (Full) සාමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර (15) පහළොවක පළපුරුද්ද සහ ඉන් වසර (05) පහක් ජ්‍යෙෂ්ඨ කළමණාකාර මට්ටමේ විය යුතුය.

(02) තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ (Full) සාමාජිකත්වය

සමග

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර (15) පහළොවක පළපුරුද්ද සහ ඉන් වසර (05) පහක් ජ්‍යෙෂ්ඨ කළමණාකාර මට්ටමේ විය යුතුය.

**වයස :** අවුරුදු 45 ට නොඅඩු සහ 60 ට නොවැඩි විය යුතුය.

**වැටුප් හා අනෙකුත් දීමනා :**

මූලික වැටුප : රු. 150,000/- (කාර්ය සාධක දීමනාව රු. 75,000/- + ප්‍රවාහන දීමනාව රු. 50,000 + රජයේ චක්‍රලේඛයන්ට අනුව තනතුරට අදාළ අනුමත ඉන්ධන දීමනාව + ජංගම දුරකථන ප්‍රතිපූර්ණ දීමනාව රු.9,000/- (මාසික) මෙම තනතුර සඳහා හිමිය)

**පත්වීමේ ස්වභාවය:** කොන්ත්‍රාත් පදනම

**සුදුසු අයදුම්කරු සතුව,**

- නවීන සිල්ලර වෙළඳපාල මෙහෙයුමක සේවා පළපුරුද්ද තිබිය යුතුය.
- විශිෂ්ඨ විශ්ලේෂණ, ගැටළු විසඳීමේ සහ සංවිධාන කිරීමේ හැකියාවන් සමග දත්ත ඇගයීමේ, සමාලෝචන කිරීමේ හා අර්ථ නිරූපනය කිරීමේ හැකියාවන් තිබිය යුතු අතර, ඉහළ ස්වයං අභිප්‍රේරිත පුද්ගලයෙකු විය යුතුය.
- ප්‍රබල නායකත්ව ගුණාංග සහ අන්තර් පුද්ගල සන්නිවේදන කුසලතා තිබිය යුතුය.
- තොරතුරු තාක්ෂණ කුසලතා ප්‍රදර්ශනය කිරීමේ ඉතා හැකියාව තිබිය යුතුය.
- ප්‍රසම්පාදන ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.
- විවිධ කණ්ඩායම් වලට නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ සනාථ කළ හැකියාව තිබිය යුතු අතර, මානව සහ අනෙකුත් සම්පත් නිසිලෙස යෙදවීමේ සහ සාර්ථකව කළමනාකරණය කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.

සෑම අයදුම්කරුවෙකුම,

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

II. තනතුරේ කාර්යභාරය හොඳින් ඉටුකිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය තිබිය යුතුය.

ඔබට නියම සුදුසුකම් හා පළපුරුද්ද ඇතිනම්, ඔබගේ ජීවදත්ත ලේඛනය, සහතික වල ඡායා පිටපත් සමග මෙම දැන්වීම පළවී දින 21 ක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතිනම් vacancies@lankasathosa.org යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි "subject" තීරුවෙහි සඳහන් කළ යුතුය).

(කෙටි ලැයිස්තුගත කළ අපේක්ෂකයන්ට පමණක් ආයතනය විසින් ප්‍රතිචාර දක්වනු ලැබේ.)

වෙළඳ අමාත්‍යංශය

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්,
[illegible]
අංක 27, 01 වන මහල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02